# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
## බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය | කාලය පැය 02

නම ...............................................................................

## I කොටස

පොදු උපදෙස්

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

★ පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට ලබා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වූයේ වයස අවුරුදු

(i) 27 දී ය. (iii) 45 දී ය.

(ii) 35 දී ය. (iv) 80 දී ය.

(2) බෞද්ධයාගේ අත්පොත හෙවත් ධම්මපදය අයත්වන්නේ සූත්‍ර පිටකයේ,

(i) දීඝ නිකායට ය. (iii) ඛුද්දක නිකායට ය.

(ii) අංගුත්තර නිකායට ය. (iv) සංයුක්ත නිකායට ය.

(3) ''චතු අප්පමඤ්ඤා'' ලෙස හඳුන්වන්නේ,

(i) සතර සංග්‍රහ වස්තු ය. (iii) සතර සතිපට්ඨාන ය.

(ii) සතර ඍද්ධිපාද ය. (iv) සතර බ්‍රහ්ම විහරණ ය.

(4) පුද්ගලයෙකු බෞද්ධයෙකු වීමේ පළමු පියවර වන්නේ,

(i) පන්සිල් ආරක්ෂා කිරීමෙන්ය. (iii) තෙරුවන් සරණයාමෙන් ය.

(ii) දෙමාපියන් බෞද්ධ බැවින් ය. (iv) භාවනා කිරීමෙන් ය.

(5) සීලයේ පදනම ලැජ්ජාව හා බියයි. එය හඳුන්වන ධර්මානුකූල වචන නම්,

(i) විරමණය යි. (iii) හිරි හා ඔත්තප්ප යි.

(ii) සමාදානය යි. (iv) සීලය යි.

(6) ත්‍රිශික්ෂාවට අයත් නොවන්නේ,

(i) සීල. (iii) වීර්යය.

(ii) සමාධි. (iv) ප්‍රඥා.

(7) බුදු සසුනේ දීර්ඝකාලීන අත්දැකීම් ඇති (චිරරාත්‍රඥ) භික්ෂුණීන් වහන්සේලා අතර අගතනතුර දැරුවේ.

(i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි. (iii) ඛේමා තෙරණියයි.

(ii) උප්පලවන්නා තෙරණයයි. (iv) භද්දකච්චානා තෙරණියයි.

(8) බුදුරජාණන් වහන්සේ සුනීත, සෝපාක වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවැති,

(i) නම්‍යශීලීත්වය යි.
(ii) අකම්පිත බව යි.
(iii) ඍජු බව යි.
(iv) කාරුණික බව යි.

(9) ආගන්තුක සංග්‍රහයක් වුවද පිළිගැනීමට සුදුසු වන නිසා සංඝරත්නය,

(i) උජුපටිපන්න නම් වේ.
(ii) පාහුනෙණය නම් වේ.
(iii) සාමීචිපටිපන්න නම් වේ.
(iv) දක්ඛිණෙය්‍ය නම් වේ.

(10) "සුභරතාවය" යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) ලද දෙයින් සතුටු වීම.
(ii) පෝෂණය කිරීම පහසුය.
(iii) ඉන්ද්‍රිය සංවරයයි.
(iv) පැවැත්ම සැහැල්ලු වීමයි.

(11) අටලෝ දහමින් කම්පා නොවීම උතුම් මංගල කාරණාවක් බව දක්වා ඇති සූත්‍රය වන්නේ,

(i) මහාලි සූත්‍රය යි.
(ii) මහා මංගල සූත්‍රය යි.
(iii) මහා සතිපට්ඨාන සූත්‍රය යි.
(iv) සිඟාලෝවාද සූත්‍රය යි.

(12) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය යන්නෙන් හඳුන්වන්නේ,

(i) කය වචනය සංවරය සීලය යි.
(ii) සිත, කය, වචනය සංවර කර ගැනීමයි.
(iii) තුන් ආකාරයකින් සිලය ආරක්ෂා කිරීමයි.
(iv) තමා උපමා කොට වරදින් මිදීමයි.

(13) සිගාලෝවාද සූත්‍රයේ දී ගිහි පැවදි සම්බන්ධතාවය උපමාකර ඇති දිශාව වනුයේ,

(i) නැගෙනහිර දිශාවට යි.
(ii) බටහිර දිශාවටයි
(iii) උතුරු දිශාවට යි.
(iv) උඩ දිශාවට යි.

(14) බලංගොඩ ආනන්ද මෛත්‍රී මහා නායක මාහිමියන්ගේ ගිහි නාමය වන්නේ,

(i) කුලතුංග බංඩාර
(ii) රූබෙල් ගුණවර්ධන
(iii) විලියම්
(iv) මද්දුහාමි

(15) අතීතයේ තුන් සිංහලය ලෙස හඳුන්වා ඇත්තේ,

(i) අනුරාධගාම, පුලස්තිනුවර, විජයපුර
(ii) පිහිටි, සීගිරිපුර, කාචරගාම ය.
(iii) රුහුණු, පිහිටි, මායා ය.
(iv) මායා, සෙංකඩගල, දඹදෙණිය.

(16) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥා කොටසට අයත් අංග වනුයේ,

(i) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප ය.
(ii) සම්මා වාචා, සම්මා ආජීව ය.
(iii) සම්මා සති, සම්මා සමාධි ය.
(iv) සම්මා වායාම, සම්මා වාචා ය.

(17) බුදු දහමේ සඳහන් අකුසල මූලයන් ලෙස සැලකෙන්නේ,

(i) අලෝභ, අද්වේෂ ආමෝහ.
(ii) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම.
(iii) ලෝභ, ද්වේෂ, මෝහ.
(iv) සීල, සමාධි, ප්‍රඥා

(18) ''සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා'' යන කවිය අඩංගු ග්‍රන්ථය ලෙස දැක්වෙන්නේ,

(i) සිරිත් මල්දම යි.
(ii) ලෝවැඩ සඟරාව යි.
(iii) බුදුගුණ අලංකාරය යි.
(iv) සුභාසිතය යි.

(19) බුදුන්වහන්සේගේ සර්වඥ ධාතු වැඩිම ප්‍රමාණයක් නිදන් කොට ඉදිකර ඇති ස්ථූපය කුමක්ද?

(i) ථූපාරාමය.
(ii) අභයගිරිය.
(iii) රුවන්වැලිසෑය.
(iv) ජේතවනය.

(20) ''අභිධජ මහා රට්ඨගුරු'' යන ගෞරව නාමයෙන් පිදුම් ලැබූ භික්ෂූන් වහන්සේ වන්නේ,

(i) එස් මහින්ද හිමි ය.
(ii) කුඩාපොල හිමි ය.
(iii) ආනන්ද මෛත්‍රී හිමි ය.
(iv) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

★ **පළමු ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

(1) දෙවන වාරයට නියමිත ඇගයීම ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඇගයීම සඳහා යොදාගත් පාඩමේ නම කුමක්ද?

(ii) එහි දී ඔබට ගුරුවරයා ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.

(iii) ඔබ මෙම සාකච්ඡා මණ්ඩපය සඳහා තොරතුරු සපයාගත් ක්‍රම දෙකක් ලියන්න.

(iv) මෙම ඇගයීම සිදු කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.

(v) මෙහිදී ඔබ දියුණු කර ගත් කුසලතා දෙකක් ලියන්න.

(vi) ආර්ය අෂ්ඨාංගික මාර්ගය සීල ශික්ෂාවට අයත් මාර්ගාංග දෙකක් ලියන්න.

(vii) චාරිත්‍ර සීලය හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(viii) පන්සිල්වල ඔබ කැමැති සිල්පද දෙකක තේරුම ලියන්න.

(ix) පන්සිල් රැකීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

(x) යහපත් සිරිත් දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

(2)

(i) බුදුරජාණන් වහන්සේ අවසාන වස් කාලය ගත කළ ගම හා අවසන් දානය පූජා කලේ කවුරුන්දැයි නම් කරන්න. (ලකුණු 2)

(ii) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති විශිෂ්ඨ නායකත්ව ලක්ෂණ 03ක් නම් කරන්න. (ලකුණු 3)

(iii) බුද්ධ චරිතය තුළින් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ආදර්ශ මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 5යි)

(3)

(i) ''සුකරානි අසාධූනි'' යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)

(ii) ඉහත ගාථාවේ තේරුම ලියා දක්වන්න. (ලකුණු 3යි)

(iii) අයහපතින් වැළකී යහපත් ක්‍රියාවල යෙදීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5යි)

(4)

(i) සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කාහට ද? (ලකුණු 2යි)

(ii) ගිහියන් විසින් පැවිදි උතුමන් වෙත දැක්විය යුතු යුතුකම් 03ක් ලියන්න. (ලකුණු 3යි)

(iii) යුතුකම් වගකීම් ඉටු කිරීම තුළින් යහපත් සමාජයක් බිහිවෙන ආකාරය විස්තර කරන්න. (ලකුණු 5යි)

(5)

(i) මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ නොකළ යුතු වෙළඳාම් 3ක් දක්වන්න. (ලකුණු 3යි)

(iii) යහපත් ජීවිතයක් ගත කිරීමට ඔබ විසින් පිළිපැදිය යුතු බෞද්ධ සාරධර්ම මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 5යි)

(6)

(i) චතුරාර්ය සත්‍යය අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) තණ්හාවේ ප්‍රභේද 03 නම් කරන්න. (ලකුණු 3යි)

(iii) සම්මා වාචා හෙවත් යහපත් වචන භාවිතයේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුනු 5යි)

(7) පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) අටමස්ථානය

(ii) ආනාපානසති භාවනාව

(iii) භද්දකච්චානා තෙරණිය

(iv) සිව් බඹ විහරණ

(ලකුණු 2 x 5 = 10)